# පරීක්ෂක වාර්තාව

## අදියර II විභාගය - 2022 ජනවාරි

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය
(Advanced Financial Accounting & Costing)

---

## A කොටස

### ප්‍රශ්න අංක 01

මෙය ලකුණු 25 ක් සඳහා වූ අනිවාර්ය ප්‍රශ්නයකි. සම්පූර්ණ නිර්දේශ පත්‍රය ආවරණ කිරීමට ප්‍රශ්නය සැලසුම්කර තිබුණි. කෙසේවෙතත්, අයදුම්කරුවන් සුළු ගණනකට පමණක් සම්පූර්ණ ලකුණු ලබා ගැනීමේ හැකියාව තිබුණි.

පහත දැක්වෙන පොදු දුර්වලතා සහ වැරදි දක්නට ලැබුණි:

**1.1** මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග පිළිබඳ දැනුම පරීක්ෂාකරන ලද අතර අයදුම්කරුවන්ගෙන් බහුතරය නිවැරදිව උත්තරලියා තිබුණි.

**1.2** වත්කම් ඉවත් කිරීම සහ ඉවත් කිරීමේදී ලැබූ ලාභය හෝ අලාභය ගණනය කිරීම පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත. අයදුම්කරුවන් සැලකිය යුතු ගණනක් නිවැරදිව උත්තර සපයා තිබුණි. කෙසේවෙතත් සමහර අයදුම්කරුවන් උත්තර ලිවිමට අසමත් වූහ.

**1.3** ණයකරහිමියන් පිළිබඳ දැනුම පරීක්ෂාකර ඇති අතර බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි ලෙස උත්තර ලියා තිබූ නමුත් සමහර අයදුම්කරුවන් උත්තර ලිවීමට අසමත් විය.

**1.4** 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය පිළිබඳව දැනුම පරීක්ෂාකරන ලද අතර බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව උත්තර ලියා තිබූ නමුත් සමහර අයදුම්කරුවන් උත්තර ලිවීමට අසමත් විය.

**1.5** පොදු කාර්ය අන්තර්ග්‍රහණය පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාකර ඇති අතර අයදුම්කරුවන් සැලකිය යුතු ගණනක් නිවැරදි උත්තරය දීමට සමත් වී ඇත.

**1.6** වත්කමක්, ජංගම වත්කමක් ලෙස වර්ගීකරණය කිරීමට සපුරාලිය යුතු නිර්ණායක දෙකක් සඳහන් කිරීම අවශ්‍යකර තිබූ අතර, බොහොමයක් අයදුම්කරුවන් එම නිර්ණායක දැක්වීමට අසමත් වූහ.

**1.7** කැලි පදනම් කරගත් ක්‍රමයක වාසි තුනක් සඳහන් කිරීම අවශ්‍ය කර තිබූ අතර, අයදුම්කරුවන්ගෙන් බොහොමයක් නිවැරදි උත්තර ලියා තිබුණේ නැත. කැලි පදනම් කළ ගෙවීම් පද්ධති පිළිබඳ නිසි දැනුමක් ඔවුන්ට තිබූ බවක් නොපෙණුනි.

**1.8** හවුල් ව්‍යාපාරයක කැප කළ අනුපාතය ගණනය කිරීම අවශ්‍යකර තිබූ අතර අයදුම්කරුවන්ගෙන් බොහෝ දෙනෙකු එය නිවැරදි ලෙස ගණනය කර තිබුණි. කෙසේ වෙතත් අයදුම්කරුවන් සැලකිය යුතු ගණනක් නිවැරදි උත්තරය සැපයීමට අසමත් විය.

**1.9** ප්‍රතිපාදනයක් (provision) සහ අසම්භාව්‍ය වගකීමක් (a contingent liability), අතර වෙනස කෙටියෙන් පැහැදිලි කිරීම අපේක්ෂා කර තිබුණි. බොහොමයක් අයදුම්කරුවෝ ප්‍රශ්නයට උත්තර ලිවීමට අසමත් වූහ. අයදුම්කරුවන් සුළු ප්‍රමාණයක් උත්තර ලිවීමට සමත්ව තිබුණි.

**1.10** ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු [First In First Out (FIFO)] ක්‍රමය මත තොග ඇගයීම් ගණනය මෙම ප්‍රශ්නයෙන් විස්තර කිරීම අවශ්‍ය කර තිබුණි. අයදුම්කරුවන් සැලකිය යුතු ගණනක් නිවැරදි උත්තර සපයා තිබුණි. කෙසේ වෙතත් ඇතැම් අයදුම්කරුවන්ට ගබඩා ලෙජරයේ ආකෘතිය පිළිබඳ වැටහීමක් තිබුණේ නැත. තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## <u>B කොටස</u>

### ප්‍රශ්න අංක 02

කේවලස්වාමී ව්‍යාපාරයක් පිළිබඳ සපයාදී තිබූ අසම්පූර්ණ මූල්‍ය තොරතුරු මත පදනම්ව ශේෂ පිරික්සුම පිළියෙළ කිරීමේ හැකියාව මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කෙරේ. අයදුම්කරුවන් බොහොමයක් ගැනිලි, ගැණුම්, ආරම්භක තොගය සහ අවසාන තොගය (විකුණුම් පිරිවැය), පිළිබඳ ගැලපීම් නිසි ලෙස අවබෝධ කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. තවද, බොහොමයක් අයදුම්කරුවන් ආරම්භක ප්‍රාග්ධනය නිවැරදිව හඳුනා ගැනීමට අසමත්ව තිබූ අතර සමහර අයදුම්කරුවන් ශේෂ පිරික්සුම වෙනුවට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ ආදායම් ප්‍රකාශනය පිළියෙල කර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

### ප්‍රශ්න අංක 03

හවුල් ව්‍යාපාර පිළිබඳ මූලික දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාවට ලක් වී තිබූ අතර හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම් පිළියෙළ කිරීම අපේක්ෂා කර තිබේ. අයදුම්කරුවන් ස්වල්පදෙනෙකු පමණක් හොඳින් උත්තර ලියා සම්පූර්ණ ලකුණු උපයාගෙන තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරයට ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම් පිළියෙල කිරීම පිළිබඳ පැහැදිලි දැනුමක් නොතිබිණි. මීට හේතු වූයේ එක් එක් ගිණුම් සඳහා අවශ්‍ය අදාල සටහන් ඔවුන්ට හඳුනා ගැනීමට නොහැකි වීමය.

පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය෴

(1) කීර්තිනාමය සහ ප්‍රත්‍යාගණන සංචිත ජංගම ගිණුමේ ගලපා තිබුණි.

(2) හවුල්කරු විශ්‍රාම ගැනීමේදී කීර්තිනාමය ගණනය කිරීම පිළිබඳවද දැනුමක් නොමැති වීම.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

## ප්‍රශ්න අංක 04

ලාභ නොලබන සංවිධානයක ආදායම් සහ වියදම් ගිණුම් සහ එහි ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාකර ඇත. අයදුම්කරුවන් බොහෝ දෙනෙක් ප්‍රශ්නයට උත්තර ලියා තිබූ නමුත් සම්පූර්ණ ලකුණු ලබා තිබුණේ නැත. එමෙන්ම සමහර අයදුම්කරුවන් ප්‍රශ්නයට උත්තර ලිවීමට අසමත් වී තිබුණි.

නිරීක්ෂණය කරන ලද පොදු වැරදි පහත දක්වා ඇත:

(1) ආදායම් ප්‍රකාශනයේ සටහන් කළ යුතු දෑ ආදායම් හා වියදම් ගිණුමේද, ඊට ප්‍රතිලෝම (vise –versa) වශයෙන්ද සටහන් කර තිබුණි.

(2) සමහර අයදුම්කරුවන් හර සහ බැර සටහන් පටලවාගෙන තිබුණි.

(3) අයදුම්කරුවන් බොහෝ දෙනෙකුට සාමාජික ගාස්තු නිවැරදිව ගණනය කිරීමට හැකි වී නැත.

(4) ක්‍රීඩා උපකරණ හා ලී බඩු මත ක්ෂය නිසියාකාරව ආදායම් සහ වියදම් ගිණුමේ සහ ආදායම් ප්‍රකාශනයේ ගලපා නොතිබුණි.

(5) ආදායම් සහ වියදම් ගිණුමේ සහ ආදායම් ප්‍රකාශනයේ ක්‍රීඩා සමාජයේ වියදම් නිසි පරිදි බෙදා වෙන්කර තිබුණේ නැත. තිබුණි.

(6) සමහර අයදුම්කරුවන් වැටුප් සහ වේතන, විදුලිය, ජලය සහ ගොඩනැගිලි මත කුලිය ප්‍රශ්නයේ උපදෙස් දී ඇති පරිදි බෙදා හැර නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 05

**(a)** සේවකයෙකුගේ සතියක ඉපැයීම් ගණනය කිරීමේ හැකියාව මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාකර තිබේ. ප්‍රශ්නයට උත්තර ලිවීමේදී වෙලාව හා අදාල ඒකක ප්‍රමාණය වරදවා තේරුම්ගෙන තිබීම නිසා සම්පූර්ණ උත්තරය වැරදී තිබුණි. එමෙන්ම බොහෝ අයදුම්කරුවන් නිවැරදි ඉපයීම ගණනය කිරීමට සමත් වී ඇත.

**(B) (a)** ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) සහ යළි ඇණවුම් මට්ටම ගණනය කිරීමේ හැකියාව පරීක්ෂාකර ඇත. නිවැරදි සූත්‍රය නොදන්නාකමින් අයදුම්කරුවන් බොහෝ දෙනෙකුට උත්තර ලිවීමට නොහැකි වී තිබේ. එමෙන්ම අයදුම්කරුවන් බොහෝ දෙනෙකුට වාර්ෂික රඳවා ගැනීමේ පිරිවැය නිවැරදිව ගණනය කිරීමට නොහැකි වී තිබුණි.

**(b)** අයදුම්කරුවන්ගෙන් බහුතරය යලි ඇණවුම් මට්ටම ගණනය කර තිබූ අතර අයදුම්කරුවන් ඉතා සුළු ගණනක් උත්තර ලිවීමට සමත් වී තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

## ප්‍රශ්න අංක 06

**(A)** නිෂ්පාදන ආයතනයක විවිධ දෙපාර්තමේන්තු අතර පොදුකාර්යය පිරිවැය විභජනය කිරීම පිළිබඳව මූලික දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාකර තිබේ. අයදුම්කරුවන් බෙහෝ දෙනෙකු පොදුකාර්ය විභජනය කිරීමේ වගුව නිවැරදි ලෙස පිළියෙල කර තිබූ නමුත් සේවා දෙපාර්තමේන්තුවේ පිරිවැය නිශ්පාදන දෙපර්තමේන්තු අතර නිසි ලෙස විභජනය කර තිබුණේ නැත. මෙහිදී සමහර අයදුම්කරුවන් උත්තර දහස් ගණනින් ලබා ගැනීමට උත්සාහ කර ඇති අතර, සමහර සංඛ්‍යා දහස් ගණන් වලට හරවන්නේ නැතිව ගෙන තිබෙනු දක්නට ලදී.

**(B)** කාර්යයක් සඳහා අයකළ යුතු මිල ගණනය කිරීම පිළිබඳව මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාකර ඇත. අයදුම්කරුවන් බෙහොමයක් නිවැරදි ලෙස උත්තර ලියා තිබුණි. අයදුම්කරුවන් සුළු ගණනක් නිවැරදි ලෙස ලාභය ගණනය කිරීමට අසමත් වී ගණිතමය වැරදි නිසා සම්පූර්ණ ලකුණු අහිමිකරගෙන තිබුණේය. තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## C කොටස

## ප්‍රශ්න අංක 07

සීමාසහිත පෞද්ගලික සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළයෙල කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරිම මෙම ප්‍රශ්නයෙන් සිදුකර ඇත. එය **(a)** සහ **(b)** යන කොටස් දෙකෙන් සමන්විත විය. **(a) කොටසින්** විස්තීරණ ආදායම් ප්‍රකාශනයක් ද **(b) කොටසින්** මූල්‍ය තත්ව ප්‍රකාශනයක් ද පිළියෙල කිරීම පිළිබඳව පරීක්ෂා කර තිබේ.

සීමාසහිත පෞද්ගලික සමාගමේ කළමණාකාරීත්වයේ භාවිතය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම අපේක්ෂා කර තිබුණි. අයදුම්කරුවන් බොහොමයක් ප්‍රශ්නයට උත්තර ලියා තිබූ අතර, අයදුම්කරුවන් සුළු පිරිසක් පමණක් සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට සමත් වුහ.

නිරීක්ෂණය වූ පොදු වැරදි සමහරක් පහත දක්වා ඇත:

**(a) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම:**

(1) සමහර අයදුම්කරුවන් විසින් ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීමේදී සාමාන්‍යයෙන් පිළිගත් ආකෘතිය අනුගමනය කර තිබුණේ නැත.

(2) අවසාන තොගය ගැලපීම බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදිව ගලපා තිබුණේ නැත. තොග හානි සම්බන්ධව නව ගිණුම්කරණ ප්‍රමිති ඔවුන් සැලකිල්ලට ගෙන නොතිබුණි. අයදුම්කරුවන් සුළු ගණනක් එය නිවැරදිව සිදු කර තිබුණි.

(3) තම තමන්ගේ පෙර වැඩ වලදී ආදයම් බදු ගැලපීම අයදුම්කරුවන්ගෙන් බහුතරය විසින් පෙන්වා නොතිබුණු අතර අදාල වර්ෂය වෙනුවෙන් වූ නිවැරදි ආදායම් බදු ප්‍රමාණය ගණනය කර තිබුණේද නැත.

(4) අයදුම්කරුවන් බොහොමයක් ගං වතුරෙන් හානියට පත් වු තොග පිළිබඳව සහ අනුමතව තිබූ

රක්‍ෂණ හිමිකම්පෑම ද සම්බන්ධ කොට අවසන් තොග ගැලපීම නිවැරදි ආකාරයෙන් කර තිබුණේ නැත. තිබුණි.

(5) විකුණුම් කොමිස් වියදම් අයිතමයක් වුවද අයදුම්කරුවන් එය ආදායමක් ලෙස සලකා ආදායම් ප්‍රකාශනයේ සටහන් කර තිබුණි.

(6) අයදුම්කරුවන්ගෙන් බොහොමයක් ණයකර පොළිය නිවැරදිව ගණනය කර තිබුණේ නැත. ඔවුන් වාර්ෂික පොළිය ගණනය කර නොතිබූ අතර ගෙවන ලද ණයකර පොළිය පමණක් ගිණුම්ගත කර ඇත. තිබුණි.

(7) බොහොමයක් අයදුම්කරුවන් රු.3,310,000/- ක බොල් ණය ආදායම් ප්‍රකාශනයේ පෙන්වා ඇත. බොල් ණය ඌණ ප්‍රතිපාදන නිවැරදි ලෙස ගණනය කර තිබුණේ නැත. තිබුණි.

(8) සමහර අයදුම්කරුවන් විසින් උපචිත හා කලින් ගෙවීම් මූල්‍ය ප්‍රකාශන වල නිසිලෙස පෙන්වා නොතිබුණි.

(9) ආදායම් ප්‍රකාශනයෙහි අය කළ යුතු ක්‍ෂය පිළිබඳ සමහර අයදුම්කරුවන්ට දැනුමක් නොතිබුණි. ඔවුන් සමුච්චිත ක්‍ෂය ගිණුමේ සඳහන් කර ලකුණු 5 ක් අහිමිකරගෙන තිබුණි.

(10) පරිපාලන වියදම් සහ බෙදාහැරිමේ වියදම් සදහා වු සවිස්තර පෙරවැඩ සමහර අයදුම්කරුවන් අමුණා නොතිබීම හේතුවෙන් කුඩා ලකුණු ප්‍රමාණයක් උපයාගැනිමට අසමත් විය.

(11) සමහරක් අයදුම්කරුවන් වර්ෂය සඳහා වු ආදායම් බදු ප්‍රමාණය හදුනාගෙන දක්වා නොතිබුණි.

(12) සමහර අයදුම්කරුවන් සංඛ්‍යාවන් දහස් ගණනින් පෙන්වා තිබු අතර සමහර සංඛ්‍යා දහස්ගණන් වල සම්පුර්ණ තත්වයට නොගෙන පෙන්වා තිබුණි. එමනිසා සටහන් කළ ප්‍රමාණයන් සාවද්‍යවීම හේතුවෙන් සමහර අයදුම්කරුවන් ලකුණු උපයාගැනිමට අසමත් වුහ.

**(b) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරිම:**

(1) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි උපචිත සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල සඳහා දායකත්ව සහ කලින්ගෙවු ගෙවල්කුලි නිවැරදිව සටහන්කර නොතිබුණි.

(2) නිවැරදි සමුච්චිත ක්ෂය සංඛ්‍යා සඳහන් නොකිරීම හේතුවෙන් සමහර අයදුම්කරුවන් අඩු ලකුණු ලබාගෙන තිබුණි.

(3) අයදුම්කරුවන් බොහොමයක් ගෙවියයුතු ආදායම්බදු ප්‍රමාණය නිවැරදි ලෙස පෙන්වා නොතිබුණි.

(4) වත්කම් මත ක්ෂය කිරිම් වැඩ පත්‍රිකාවේ ගණනයකර තිබු නමුත් සමහර අයදුම්කරුවන් එය මූල්‍ය ප්‍රකාශනයේ නිවැරදි ස්ථානවල සටහන් කර තබුණේ නැත. තිබුණි.

(5) සමහර අයදුම්කරුවන් ගෙවියයුතු ණයකර පොලී ප්‍රමාණය ණයකර ප්‍රමාණයට එකතුකර, දිගුකාලීන බැරකම් යටතේ ඉදිරිපත් කර තිබුණි.

(6) බොහොමයක් අයදුම්කරුවන් අවසාන තොගයෙන් තොග හානිය අඩුකර තිබුණේ නැත. තිබුණි.

(7) තොග හානිය සඳහා අනුමතව තිබු රක්ෂණ හිමිකම ජංගම වත්කම් යටතේ පෙන්වා තිබුණේ නැත.

(8) සමහර අයදුම්කරුන් වෙළඳ ලැබිය යුතු මුදලින් බොල් ණය සඳහා ප්‍රතිපාදනය අඩුකර තිබුණේ නැත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

\- - -

**විභාගයේදී කාර්ය සාධන මට්ටම වැඩිදියුණු කරගැනීම සඳහා අපේක්ෂකයින්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:**

(1) ස්ව-අධ්‍යයන පාඩම් මාලා හොඳින් අධ්‍යයනය කර ඒවායේ අන්තර්ගත කරුණු තේරුම්ගත යුතුය.

(2) කළ යුතු ක්‍රියා පද නිර්වචනයන් තේරුම් ගැනීම සහ ප්‍රශ්න පත්‍රය අවසානයේ දී ඇති කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව මත පදනම්ව ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පුහුණු විය යුතුය.

(3) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වල අන්තර්ගත කරුණු අධ්‍යයනය කර අවම වශයෙන් ප්‍රශ්න පත්‍ර 2-3 කටවත් පිළිතුරු සැපයීමට පුහුණු වී ප්‍රශ්න ඉදිරිපත් කරන ආකාරය අවබෝධ කර ගත යුතුය.

(4) විභාගයට පෙර නියමිත කාලය වෙන් කරගෙන පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු සපයා පුහුණු වීම මගින් විභාගයේදී කාලය කළමණාකරණයට ඉවහල් වේ.

(5) විභාගයේදී කියවීමට හැකි ආකාරයෙන් අත් අකුරු පැහැදිලිව ලිවිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම ආරම්භ කිරීමට පෙර, ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.

(7) ප්‍රශ්න හොඳින් තේරුම්ගෙන ගැලපෙන හා නිවැරදි පිළිතුරු පිළිතුරු සැපයීම සඳහා විභාගය අවස්ථාවේදී පැහැදිලි මනසක් පවත්වා ගත යුතුය.

(8) එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය අනුව පිළිතුරු සැපයීමට ගත කළ යුතු කාලය වෙන් කර ගත යුතු අතර එමගින් සියළු ප්‍රශ්න සඳහා කාර්යක්ෂමව පිළිතුරු සැපයීමට හැකි වනු ඇත.

(9) පිළිතුරු පොත් භාරදීමට පෙර, අවශ්‍ය කරන සියළු ප්‍රශ්න වලට පිළිතුරු ලියා තිබේද, නිසි පරිදි අංක යොදා තිබේද ආදිය දෙවරක් පරීක්ෂා කර බැලිය යුතුය.

\- * * * -